





# ආදරබර මියුරු කල්පනා

ගැහැණු ළමයෙකු කෙරෙහි ආදර සිතුවිල්ලක් පිරිමි ළමයෙකු ගේ සිතේ මුලින්ම පහල වෙන්නේ කුමන වයසේ දී ද යන්න නිශ්චිතව කිවහැකි දෙයක් යැයි මම නොසිතමි. එය සිදුවන්නේ වයස දසය ලබා උසස් පෙළ ඉගෙන ගන්නා කාලයේ දී විය හැකිය. ඊට කලින් සාමාන්‍ය පෙළ පන්තිවල දී විය හැක. ප්‍රාථමික ශ්‍රේණිවල දී විය හැක. සමහර විට මොන්ටිසෝරියේ දී ද විය හැකිය.

මා දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ වසරේ දී මට පන්තියේ සිටි ගැහැණු ළමයෙකු වූ දේශිකා ගෙන් වෙසක් සුභපැතුම් පතක් ලැබුණි. මගේ සිතට ඇති වූයේ ඉතාමත් ලැජ්ජාවකි. එය විලිලැජ්ජාව වැනි දෙයක් විය යුතුය.

දැන් ඉතිං, මා කුමක් කළ යුතුද? මට මුලින්ම කිසිත් සිතාගත නොහැකි විය.

ඔබට වෙසක් සුභ පැතුම් පතක් ලැබුණු විට කළ යුත්තේ, එය ඔබට දුන් පුද්ගලයාට ද පෙරළා වෙසක් සුභ පැතුම් පතක් දීමයි. මට එය කළ හැකි එකම ක්‍රමය වූයේ මේ සුභ පැතුම් පත ගැන අම්මාට කියා ඇය ලවා සුභ පැතුම් පතක් මිළට ගැනීමයි. එනමුත් එය විලිලැජ්ජාව ඇතිව කළ හැකි දෙයක් නොවීය. මා කළේ, මට ලැබුණු සුභ පැතුම් පතේ ම ලියා තිබු නම් දෙක කපා දමා මාරු කර ලියා ආපසු ඒ සුභ පැතුම් පත ම දේශිකා ට දීමයි.

ඉන් පසු මට දේශිකාගෙන් වෙසක් හෝ නත්තල් හෝ සුභ පැතුම් පත් නොලැබිණ.

මට එදා ඒ ඇතිවුණු ලැජ්ජාව වනාහී ආදරයක මූලික සිතුවිල්ල විය හැක.

ඊළඟ වසරේ මා තුන්වෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන වසරේ දී අපේ පන්තියේ පළමුවෙනියා වීමට මා හා තරගයක් දුන් නීතා නම් ගැහැණු ළමයා කෙරෙහි මට යම් ආකාරයක කැමැත්තක් ඇතිවිය. ඒ ඇය වාර විභාගවලදී චිත්‍ර, මැහුම්/අත්වැඩ වැනි විෂයන්ට මට වඩා ලකුණු ලබා ගන්නා නිසා ඇති වුණු බිය මුසු හැඟීමක් විය හැක.



ඒ වසර මැද දී ඇගේ වයස අඩු බව කියා පාසලේ ලොකු මහත්තයා ඇයව පහල පන්තියට මාරු කර ඇ යායින් පසු ඒ කැමැත්ත එක්වරම වාගේ අමතක වී ගියේය. ගැහැණු ළමයෙකුට ඇති කැමත්ත අකමැත්තට වඩා පන්තියේ පළමුවෙනියා වීම ඒ දිනවල අපට වැදගත් දෙයකි.

ආදරබර මියුරු කල්පනාවල මූලික අවස්ථා ලෙස සැලකිය හැකි ඉහත සඳහන් සංසිද්ධීන් දෙකෙන් මා ඉදිරි පිම්මක් පැන්නේ හතරවෙනි ශ්‍රේණියේ දී ය.
හෝඩියේ පන්තියේ දී මට චිත්‍ර අඳින්ට ඉගැන්වූ රානිකා නම් ගැහැණු ළමයා සමග මා යලිත් එකම පන්තියකට අනුයුක්ත වී තිබුණි. රානිකා සම්බන්ධයෙන් මගේ සිතේ මා පෙර කිසිදු නොදැන සිටි ආකාරයක පහන් සිතුවිලි නැගෙන්නට විය.

මේ කාලය වන විට අපේ පන්තියේ සිටි සම වයසේ සිටි ගැහැණු පිරිමි ළමෝ තව දුරටත් බබා ලා නොවූහ. අප කොල්ලන් සහ කෙල්ලන් එකිනෙකාට විරුද්ධ ලිංගිකයින් ගේ නම් පට බැඳ උසුළු විසුළු කරන්නට පටන් ගත්තේ තුන්වන වසරේ දී ය.

රානිකා පිළිබඳව මගේ සිතේ ඇත්තේ කවරාකාරයේ හැඟීමක් දැයි මට සැබෑ ලෙසම පැහැදිලි වූයේ, අප සමග එකම පන්තියේ උගත් සුගත්, තමන් රාජිකා කෙරෙහි ඇල්මක් දක්වන බව මා සමග කී මොහොතේදී ය. ඔහුගේ ඒ ප්‍රකාශයත් සමගම මගේ සිතේ තිබූ ප්‍රාථමික මට්ටමේ සිතුවිල්ල නිසි පරිදි වැඩෙන්නට විය. ඔහු සමග ඇය ගැන කතා කිරීමෙන්, ඇය නිරීක්ෂණය කිරීමෙන් මම තෘප්තියක් ලැබුවෙමි. එවකට ජනප්‍රිය හින්දි ගීතයක් ද, ඇගේ නම යොදා ගායනා කළ හැකි බව මම සුගත්ට කියා දුන්නෙමි.
ඇය මා පරදා පන්තියේ පළමුවැනියා වූවද ඒ ආදරබර මියුරු කල්පනාවල අඩුවක් නොවීමෙන් මා තුන්වැනි ශ්‍රේණියේ දී තිබූ යම් කඩඉමක් ජයගෙන ඇති බව මටම වැටහිණි.

එහෙත් අවාසනාවක මහත!

ඒ වසරේ මැද දී රානිකා අප පාසල අතහැර කොළඹ නම ගත් විද්‍යාලයක ඉගෙනුම පිණිස ගියාය.
සුගත් ගේ ද, මගේ ද, ආදරබර මියුරු කල්පනා එතැනින් හමාර විය.

යලිත් පන්තියේ පලමුවෙනියා වීමට ඉඩ ලැබීම මා හද වසාගත් ඒ අඳුරු වළාවේ තිබූ එකම රිදී රේඛාව විය.

# Pursuit of Success 2013



September 15th marked a key date in the Sri Lankan Youth Unite and Lead (SLYUAL) 2013 calendar. Caulfield Park Pavilion hosted the second and final professional development event for the year,Pursuit of Success.

SLYUAL is an organisation that aims to provide youth of varying backgrounds, the opportunity to enhance their professional and personal development goals in an attempt to reach the pinnacle of their careers.

Pursuit of Success gave the opportunity for current students and recent graduates, to interact with like-minded professionals who have successfully launched their careers. SLYUAL were proud to welcome the panellists Mahima Kalla(Engineering), Lorna Hu (Investment Banking), Gayani Atukorala (Law), Kieran Garigga (IT Consulting) and Lahiru Silva (Medicine).

The guest speakers engaged the audience with personal experiences and key tips to get ahead in the job market. Whilst each speaker took a vastly different approach to reach their career goals, a common theme emerged of fostering strong relationships. The first session was focused around a Q&A structure allowing the attendees to engage first hand with the panellists.

A short presentation on networking by Ambritha De Silva followed the Q&A session, highlighting the importance of first impressions. Subsequently the break gave attendees a great opportunity to engage one-on-one with their chosen panellist.
The second session saw Keynote speaker Mr Jonathan Stacey present on The Power of Entrepreneurship.

Mr Stacey is an avid entrepreneur with business interests in Australia and overseas ranging from education to technology. With experience working for American Express, Standard Chartered Bank, Deloitte and several other firms in Australia, New York and Europe, Jonathan has learnt first-hand how to get the most sought after jobs and climb company ladders. He holds qualifications from Macquarie University – Sydney, Mountbatten Institute – New York and University of Cambridge – UK. Jonathan's passion for helping young people to succeed saw him create the Youth Success Program in Melbourne of which he is Principal.

His inspiring address highlighted that there are numerous pathways to success and that academic qualifications weren't a prerequisite to launch a career.

Jonathan's own experiences as an adolescent searching for success opened his eyes to the opportunities that exist for youth today. He emphasised the importance of taking challenges head on as it is what you make of your experiences that leads you to success.
The key messages of getting involved, self-confidence and focusing on your strengths were remarkably illustrated by his entertaining anecdotes.

In summary the seminar was well received by the audience of 50 and guest presenters. SandhyaManchikanti, an attendee remarked "I thought the seminar was excellent as it was inspirational, giving a real insight into working life among a very diverse range of careers".

The seminar was a testament to the hard work of SLYUAL's organising committee consisting of; ManodyaPerera, MariessaPeiris, Avanthi Wickramasuriya, SupunWitharana, Adrian Ferdinand, Piumika De Silva, Janaka Lovell, Ambritha De Silva, PiyumiPerera and Nayomi-Naranpanawa.
For more information about Sri Lankan Youth Unite and Lead and future events find us on:
Facebook: Sri Lankan Youth Unite and Lead
Website: www.slyualmelb.net
E-mail:slyual.club@gmail.com

**SLYUAL Media Team 2013**

LANKAN
AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886
9798 2200
14/30 Tower Court
Noble Park 3174